# ආත්ම සංකල්පය
# සහ
# බුද්ධ දේශනාව

**අතිපූජනීය**
**මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේ**

**2018 නොවැම්බර් 17**



අතිපූජනීය

මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේ

## <u>කරුණාවෙන් සළකන්න:</u>

**මෙම පහත සටහන් කර ඇති සද්ධර්ම ලිපිය 2018 වසරේ නොවැම්බර් මස 17 වන දින අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේ විසින් සිදුකළ සද්ධර්ම සාකච්ඡාවකි. එය උන්වහන්සේගේ අවසරය මත, විඩියෝපටයක් ලෙස එදින පටිගත කරනු ලැබූ අතර එම දේශනාව මහ තෙරුණුවන් කථාකරන භාෂාවෙන්ම, එලෙසින්ම මෙහි ඇතුළත් කර ඇත්තේ එම දේශනාවෙහි ඇති ජීව ගුණයට සහ හරවත් බවට කිසිදු හානියක් සිදු නොවනු පිණිසයි.**

"අපි දැන් මෙච්චර දවස් එක, එක මතෘකා යටතේ මේ බුදුන් වදාළ ධර්මය කථා කරා. ශ්‍රාවකයින්ට තව ගොඩක් ප්‍රශ්න තියෙනවා, දැන් තමයි ප්‍රශ්න තියෙන බව පෙනෙන්නේ. මොකද?.. එක එක බණ අහලා, අහලා මිනිස්සුන්ට එක එක්කෙනා එක, එක දේවල් කියනවානේ, වචන කඩ, කඩා කියනවා, වචන වල අර්ථ දක්වන්ට යනවා, නිරුක්ති හොයන්ට යනවා, සූත්‍ර වරද්දලා කියනවා, අටුවාවේ වෙනත් අර්ථ කථන දුන්නා කියනවා, නොයෙකුත් දේවල් කියන සමාජයක දැන් අපි ඉන්නේ. ඉතින් සාධාරණයි. මොකද?.. අපි ධර්මය හොයන්ගිය කාලයට වඩා අද ගොඩක් සංකීර්ණ වෙලා. අද තියෙන සමාජ ජාල, වෙබ් අඩවි හින්දත් මේ මිනිස්සු එක එක්කෙනා නොයෙකුත් දේවල් දැන් කියන්ට පටන්ගෙන. භික්ශූන්ට අමතරව දැන් ගිහියො ත් බණ කියනවා. සූත්‍ර පෙරලගෙන දහලනවා. ඉතින් ඒ වගේ ගොඩාක් සංකීර්ණ තත්වයක් අද රටේ පැන තැගිලා තියෙනවා. ඉතින්, ගොඩාක් අපේ ශ්‍රාවකයෝ අතරමන් වෙලා ඉන්නේ. ඉතින්, ඒ බව පේනවා ඒගොල්ලන්ගෙන් ලැබෙන ප්‍රතිචාර වලින්.

ඉතින්, මම කල්පනා කරා... දැන් මම කලින් චතුරාර්‍ය සත්‍ය පිළිබඳ දේශනාවක් කරා. දැන් තව හිතුවා ඊට එහා පොඩ්ඩක් කථා කරන්ට. මේ ආත්ම සංකල්පය පිළිබඳව. දැන්, හුගක් අයට මේක අලුත් ප්‍රශ්න යක් නෙවේ. බුදුන්වහන්සේගේ කාලෙත් මේ ප්‍රශ්නේ තිබුනා. මේක සදාකාලික ප්‍රශ්නයක්. ඉතින්, මිනිස්සු හිතනවා මේ සදාකාලික වෙනස් නොවී යන ආත්මයක් තියෙනවා කියලා. ඒක කවදහරි ඉශ්වරයා ගාවට යනවා. එහෙම නැත්තම් මැවුම්කා ර දෙවියන් ළඟට යනවා. ඉතින්, දැන් ඒ, එක පිරිසක් ඉන්නවා ආත්මයක් ඇත, ආත්මයක් තියෙනවා කියන. තව පිරිසක් කියනවා ආත්මයක්, එහෙම එකක් නෑ. මරණෙන් සියල්ල අහෝසි වෙනවා කියලා. ඉතින්, මේක මිනිස්සුන් හදාගත්ත චින්තනමය අන්ත දෙකක්. එදත් ඕක තිබුනා. ගොඩාක් පිරිස ඇවිත් බුදුහාමු දුරුවන්ගෙන් මේක ඇහුවා, ප්‍රශ්න කරා, එවකට හිටපු සමහර ශාස්තෘවරු කිව්වා ආත්මයක් ඇත කියලා. දැන්, ආත්මයක් ඇත කියන එක බුදුන්වහන්සේ කිව්වා එක අන්තයක් කියලා. ඒ ආත්මයක් ඇත කියපු අය මොකද කරේ?... ආගම් හදාගෙන, ආත්මය ස්වර්ගයට ගෙනියන්ට හෝ ආත්මය විමුක්තිය කරා ගෙනියන්ට, විවිද පුද-පූජා, යාග-හෝම, ඇදැහිලි , චාරිත්‍ර විදි පවත්වගෙන පින්කම් කරමින් ස්වර්ගයට යන්ට කටයුතු කරා.

ඒගොල්ලෝ දැනගෙන හිටියේ එච්චරයි. ඒ, ඒගොල්ලෝ එහෙම කිව්වා . අතිත් පැත්තේ හිටපු අය, ආත්මයක් නැත කියපු අය, මුකුත් නෑ ඉතින්, පිත්කම් කරන්ට ඕනේ නෑ, ආත්මයක් නෑ, මරණෙන් පස්සේ සියල්ල ඉවරයි ඉතින් ඒ, ඒ අන්තය. එතකොට, අන්ත දෙක, ආත්මයක් ඇත කියපු එක බුදුහාමුදුරුවෝ කිව්වා 'සාස්වත වාදය' කියලා. සාස්වත කියන වචනේ පාවිච්චි කරා. ආත්මයක් නැත කියන කට්ටිය 'උච්චේද වාදියෝ' කියලා සඳහන් කරා. එතකොට, ආත්මයක් ඇත කියන අය ආගම් අදහන අය. ආගමක් හදාගත්තා ආත්මය ගලවන්ට, ස්වර්ගයට ගෙනයන්ට. ආත්මයක් නැත කියපු අය, නිරාගමිකයෝ කියලා. ආගමක් නෑ, වැඳුම්-පිදුම් කරන්නේ නෑ, එහෙම එකක් නෑ, කියලා ඔහේ කාලා-බීලා, විනෝදයෙන් ජීවත් වෙලා මිය යන්ට ඕනේ කියලා හිතුවා. ඉතින්, මේක තමයි අන්ත දෙක. දැන්, මේ දෙක, අන්ත හැටියට බුදුන් වහන්සේ දේශනා කරා. මේ දෙකම මනඃකල්පිත දෙකක් හැටියටයි බුදුන් වහන්සේ දේශනා කරේ. එතකොට, මේ බුදුහාමුදුරුවෝ මොකද්ද මේ කිව්වේ?. දැන්, බුදුහාමුදුරුවෝ ආත්මයක් ඇත කිව්වද?, එහෙම නැත්තම් ආත්මයක් නැත කිව්වද?.... හුඟාක් අය පටලවාගෙන ඉන්නවා, බුදුහාමුදුරුවෝ ආත්මවාදී, ආත්මයක් ගැන කිව්වා, පුනරුප්පත්තියක් ගැන කිව්වා, යළි ඉපදීමක් ගැන කිව්වා කියලා. දැන් මේවා ඔක්කොම පටලවගෙනනෙ ඉන්නේ. ඉතින්, අපි හරියට බුදුන්වහන්සේගේ මුළු දේශනාවම අරගෙන විග්‍රහ කරොත්, අවසාන විග්‍රහයේදී අපිට පැහැදිළිව පේනවා; බුදුන්වහන්සේගේ සූත්‍ර ගොඩාක් තියෙනවා මේ ගැන අධ්‍යයනය කරන්ට.

මම මේ ඔක්කොම සූත්‍රවල නම්-ගම්, කිය කිය එහෙම කරන්ට යන්නෙ නෑ. මේක විශ්වවිද්‍යාලයක දේශනයක් නෙවෙයි. විභාගෙ කට අපි උත්තර ලියනවා නෙවෙයි. එසේ විය යුතු නෑ. ඒ සියල්ල ගත්තහම අවසානයේ අපිට පේන දේ තමයි, බුදුහාමුදුරුවෝ ආත්මය ගැන දක්වපු සංකල්පය තමයි, ආත්මයක් ඇත කියන එක බුදුහාමුදුරුවෝ කිව්වා, එක අන්තයක්. ආත්මයක් නැත කියන එක, තව අන්තයක්. ආත්මය ඇත යන්න 'සාස්වත වාදය' හැටියටත්, ආත්මයක් නැත යන්න 'උච්චේද වාදය' හැටියටත් දැක්වුවා. බුදුන් වහන්සේ කිව්වා, මම මේ දෙකම ප්‍රතික්ෂේප කරනවා. බුදුන්වහන්සේ ආත්මයක් ඇත කියන එකත් බැහැර කරා, ආත්මයක් නැත කියන එකත් බැහැර කරා. ඒ වෙනුවට බුදුන්වහන්සේ දේශනා කරා, ඒ දෙකටම මැදින් මම දහම් දෙසනවා කියලා, අවිජ්ජා පච්චයා සංඛාරා ,සංඛාරා පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං,

නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා පස්ස, පස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භව, භව පච්චයා ජාති ,ජාති පච්චයා ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායස කියලා ක්‍රියාවලියක් පෙන්වා දුන්නා.

දැන්, කළබල වෙන්ට එපා මම පාලි වචන කිව්වා කියලා. මේ ගැන හොයන්ට මහන්සි වෙන්ටත් එපා. මොකද?...මේක අපේ ගමනට එච්චරම උපයෝගී වෙන්නේ නෑ. නමුත්, මේ අපි ඉස්සෙල්ලා බුදුන් වදාළ එක දැනගෙන ඉන්ට එපැයි. ඒ නිසයි මම මේ මාතෘකාව ගත්තේ. එතකොට, දැන් මේ අවිජ්ජා පච්චයා සංඛාරා. එතකොට, බුදුන්වහන්සේ කියන්නේ මේ 'උච්චේද වාදයවත්', 'සාස්වත වාදයවත්' නෙවෙයි. ආත්මයක් ඇත-නැත නෙවෙයි. බුදුහාමුදුරුවෝ කියනවා අවිජ්ජාව නිසා සංඛාර හටගන්නවා කියලා. එතකොට, මේ සියල්ල පටන්ගන්නේ අවිජ්ජාව නිසා. එතකොට, මොකද්ද අවිජ්ජාව කියන්නේ?...එතකොට, අවිජ්ජාව නිසා සංඛාර හටගන්නවා නම්, ඒ වගේ දිගට මම ඉස්සෙල්ලා කියාගෙන ගිය වචන ටික කියාගෙන, අන්තිමට ජරා , මරණ, ශෝක, පරිදේවනම්, එහෙමනම්, මේක තමයි පවතින්නේ. ඇරඹෙන්නේ කොතනින්ද?... අවිජ්ජාවෙන්. එතකොට, අපි පවතින්නේ අවිජ්ජාව නිසා මිසක්, වෙන මුකුත් නිසා නෙවෙයි ලෝකේ. ආත්මයක් තියෙනවද?, නැත්ද? කියන එක නෙවෙයි මෙතන තියෙන ප්‍රශ්නේ, අවිජ්ජාව. අවිජ්ජාව තියෙනකම් සංඛාර හටගන්නවා , කර්ම සකස් වෙනවා. පුඤ්ඤාභිසංඛාරා. අපුඤ්ඤාභිසංඛාරා. ආනෙඤ්ජාභිසංඛාරා. කර්ම ක්‍රියාත්මක වෙනකම්, කර්ම හටගන්නකම්, සංඛාරා පච්චයා විඤ්ඤාණං. විඤ්ඤාණයක්‍රියාත්මක වෙනවා.

විඤ්ඤාණය තියෙනකම්, විඤ්ඤාණය තනිව හටගන්නේ නෑ. නාම-රූප එක්ක හටගන්නේ. නාම-රූප තියෙනකම් නාම-රූප පච්චයා සළායතන, ඒක තියෙනකම් ඇස්, කන්, නාසය, දිව, ශරීරය, මනස කියන ආයතන හය පිහිටනවා. එතකොට, සළායතන පච්චයා පස්ස. සළායතන තියෙනකම් බාහිර තියෙන ශබ්ද, රූප, ගන්ධ, රස, ස්පර්ශ, දම්ම... ස්පර්ශ වෙලා, ස්පර්ශය හටගන්නවා. ස්පර්ශය නිසා වේදනාව හටගන්නවා. විඳීම-සුඛ වේදනාවද, දුක වේදනාවද, අදුක්ඛම-සුඛ වේදනාවද, එහෙම නැත්නම් නිරාමිස වේදනා, සාමිස වේදනා කියන විඳීම. එතකොට, විඳින්ට ගිහින් මොකද කරන්නේ?.. තණ්හාව ඇති කරගන්නවා තමන්, ප්‍රිය අරමුණේ. වේදනා පච්චයා තණ්හා. ඔය තණ්හාව නිකන් ඉන්නේ නෑ, උපාදාන කරගන්නවා.

ඒක තුළ ගොඩනගා ගන්නවා කාම භව, රූප භව, අරූප භව. ඒවගේ , විස්තර කරන්ට ගියොත් මේක ලොකු කතන්දරයක් කියන්ට වෙනවා. මම ඒක කියන්ට නෙවෙ යි මේ යන්නේ. ඒක වෙන දවසක කථා කරමු, ඕනේ උනොත්. එතකොට, උපාදාන පච්චයා භව. උපාදානය හින්දා ඊළඟට යළි පැවැත්ම හටගන්නවා, ඊළඟ භවය කොහෙද යන්නේ කියලා අවසාන කාලේ වෙනකොට, මිය යන්ට යනකොට. ඊට පස්සේ ඒ භවය  අනුව කාම භව, රූප භව, අරූප භව කියලා භව තුනක් තියෙනවා. ඊළඟට, ඒ අල්ල ගත්ත භවය අනුව,  කරපු කර්ම අනුව, උපදිනවා, ජාතිය හටගන්නවා. ඒ අනුව ජරා, මරණ හටගන්නවා. එතකොට,  මේ භවයෙන් භවයට යන්නේ හෝ මේ සිදුවන්නේ, අවිජ්ජාව මිස වෙන කිසිවක් නෙවෙයි. එතකොට, දැන් බුදුන් වහන්සේ මේක තමයි දැක්කේ එදා බෝමැඩ, බුද්ධත්වයට පත්වෙච්ච දවසේ. සතර  සතිපට්ඨානය - කායානුපස්සනා , වේදනානු පස්සනා, චිත්තානනුපස්සනා, ධම්මානුපස්සනා කියන තමා දෙස බලන, සතර සතිපට්ඨාන භාවනව පටන් ගත්තහම බුදුහාමුදුරුවෝ  දැක්කා, ඇසත් වර්ණත් ස්පර්ශ  උනහම, චක්ඛු විඤ්ඤාණය  හටගන්නවා. කනත්, ශබ්දත් ස්පර්ශ  උනහම, සෝත විඤ්ඤාණය  හටගන්නවා. ඒ වගේ, නාසයත්, ඝන්දයත් ස්පර්ශ  උනහම, ඝාන විඤ්ඤාණය , දිවත් රසයත් නිසා ජිව්හා  විඤ්ඤාණය, ඊළගට කයත් පොට්ටබ්බත් නිසා කායවිඤ්ඤාණය.

මනසත්, සිතුවිලිත් නිසා මනෝ විඤ්ඤාණය හටගන්නවා දැක්කා. එතකොට, ඇසත් වර්ණත් ස්පර්ශ වීම නිසයි චක්ඛු විඤ්ඤාණය හටගත්තේ. එතකොට, ඇස නොතිබුනානම්, එහෙම නැත්නම්, වර්ණ ස්පර්ශ නොවුනනම්, නැත්නම් ඒ දෙකම නොතිබුනානම් හෝ එකක් හෝ නැති උනානම්, චක්ඛු විඤ්ඤාණය හටගන්න පුළුවන්ද? බෑ. එතකොට, මේ දෙක තියෙන්ටත් ඕනේ. මේ දෙක ස්පර්ශ වෙන්ටත් ඕනේ. ස්පර්ශ උනහම විඤ්ඤාණය හටගන්නවා. හැබැයි,  විඤ්ඤාණය  තනිවම හටගන්නේ නෑ. විඤ්ඤාණයත් එක්කම පස්ස, වේදනා, සංඥා, චේතනා, මනසිකාර කියන ක්‍රියාවලියකුත් සිද්ධ වෙනවා. එතකොට, බුදුහාමුදුරුවෝ දැක්කා මේක තමයි හැම මොහොතෙම තප්පරයක්, තප්පරයක් නෙවෙයි, ඊටත් වඩා ඉතා සුළු කාලයකින්, වේගයෙන් සිදුවෙමින් යන ක්‍රියාවලියක් බව. මේ සිදුවීම තමයි අපි අල්ලගෙන ඉන්නේ ආත්ම සංකල්පය හැටියට, සක්කායදිට්ඨිය හැටියට. ඉතින්, ඒක, එක එක විදිහට මිනිස්සු විස්තර කරා.

මේ සක්කායදිට්ඨිය කියන එක, බුදුහාමුදුරුවෝ විසි වැදෑරුම් කියලා - රූපයේ ආත්මය ඇත, ආත්මයේ රූපය ඇත, ආත්මය රූපය කොට දකී, රූපය ආත්මය කොට දකී. ඒ වගේ හතර ක්‍රමයකට, ස්කන්ධ පහ (5) - රූප, වේදනා , සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන ස්කන්ධ පහ හතරෙන් වැඩි උනහම විසි ආකාරයි කියලා කිව්වා. මේ තමයි මිනිස්සු හිතන විදිහ. එතකොට, මේ ආධ්‍යාත්මික ආයතන බාහිර ආයතන ස්පර්ශ වීම නිසා විඤ්ඤාණය හටගැනීම තමයි අපි මේ අල්ලගත්තේ, මම, මගේ කියලා. මේක හැම මොහොතෙම සිද්ධ වෙනවා. මේ ක්‍රියාවලිය ඇතිවෙමින්, නැතිවෙමින් යන ක්‍රියාවලියක් කියලා, එයා දැක්කා. දැන් එතකොට, මේ මොහොතෙත් ඇසත්, වර්ණත් ස්පර්ශ උනහම චක්ඛු විඤ්ඤාණය හටගත්තා, ඒක හරහා මම දකිමි, මගේ දැකීම, මමයි බලන්නේ, මම දකින්නේ කියලා හදාගත්තා. ඇයි මේ එහෙම එකක් හදාගත්තේ?.. මේ පරම සත්‍ය, මේ ගැඹුරු දහම දකින්නට තරම් සාමන්‍ය කෙලෙස් බරිත සිතකට, සාමන්‍ය මනසකට බෑ. දැන් බුදුහාමු දුරුවෝ මෙතෙන්ට ආවේ කාමයන්ගෙන් වෙන්වෙලා, මාලිගාවල් තුන අතහැරලා , යශෝධරාව අතහැරලා , වනයට ඇවිල්ලා සෑහෙන උත්සාහයක් කරලා, සමථ ධ්‍යාන මගින්- අර, ආලාරකාලාම, උද්දකරාමපුත්ත හරහා ඒකත් ඉගෙනගෙන, පිරිසුදු මනසකින් තමා මේක දකින්නේ. උපේක්ශා සහගත මනසින්, පන්ච නීවරණ රහිත, ඒ කියන්නේ කාමච්ඡන්ද, ව්‍යාපාද , ථීන-මිද්ධ, උද්දච්ච-කුක්කුච්ච, විචිකිච්ඡා කියන නීවරණ නැති පිරිසිදු, ප්‍රභාශ්වර මනසින් තමයි මේ ටික දැක්කේ. ඒ දැක්කහම, තමන් දෙස බැලුවහම, මේ ක්‍රියාවලිය දැක්කා. දැන් එතොකොට බුදුන් වහන්සේට තේරුණා, එහෙනම්, මුකුත් නෑ. මේ ක්‍රියාවලිය විතරයි තියෙන්නේ.

මේ, ‘මම’ කියලා, ‘මගේ’ කියලා දේයක් නෑ. දැන් ‘මම’ දකිමි නම්, මට බලෙන් බලන්ට පුළුවන් වෙන්ට එපැයි?, එහෙම බෑ. මට, මගේ ඉදිරිපිට තියෙන වර්ණ පේන්නේ ආලෝකය තියෙනකම්. දැන් මට මෙතන ඉදන් පුළුවන්ද අඟහරු ලෝකේ බලන්ට?…බෑ නේ?, මට බ්‍රහ්ම ලෝකේ බලන්ට පුළුවන්ද?…බෑ. මට මගේ අවට තියෙන, ආයතන වලට ස්පර්ශ වන සීමාවේ තියෙන බාහිර ආයතන ස්පර්ශ උනොත් පමණයි, මට දකින්ට පුළුවන්. එතකොට, ‘මම’ මැවෙන්නේ මේ පරිසරය තුළ. මේක වේගයෙන් සිදුවන හින්දා , අපිට තේරෙන්නේ නෑ. මෙතන මේ ක්‍රියාවලියක් මිස මෙතන, වෙනත් කිසිවක් නෑ කියලා. ‘කිසිවක්’ කිව්වේ සත්වයෙක්, පුද්ගලයෙක්, මම, මගේ කියලා ගන්ට කිසිදෙයක් නෑ කියලා, දන්නේ නෑ. අර, මම කියනවා වගේ, ගිනිපෙලෙල්ලක් වේගයෙන් කරකවන කොට, අපිට ගිනි වලල්ලක් පේනවා.

ඒ වේගය නිසා ගිනි වලල්ලක් පෙනුනට, ඇත්ත ටම එතන ගිනි වලල්ලක් නෑ. ඒ හා සමානම දෙයක් තමයි මේ සිද්ධ වෙන්නේ. දැන්, මේක තමයි බුදුහාමුදුරුවෝ කිව්වේ. එතකොට, දැන් බලාගෙන ගියාහම බුදුහාමුදුරුවෝ කිව්වා, මේ හැම වෙලාවෙම සිද්ධ වෙන්නේ මේක. දැන් 'මම' කියලා කෙනෙක් කෝ?.. ඉන්නවද? දැන්, කෝ ආත්මයක්?, කෝ ඇතුළත ගන්ට යම් කිසි හරයක්, පද්ධතියක් තියෙනවද? මේ දැන් මෙතනින් එහාට ගිහිල්ලා බැලුවා. බැලුවහම, එහෙම එකක් පේන්ට නෑ. ඊලඟට බැලුවා, අතීතයේ තියෙන්ට පුළුවන්ද එහෙමනම්?....නෑ. අතීතයෙත් මේ ක්‍රියාවලියමයි සිද්ධ වෙලා තියෙන්නේ. දැන් මේ මොහො තෙත් නෑ. එහෙනම් අතීතයෙත් එහෙම කෙනෙක්, ඔය කියන ආත්මයක්, සංකල්පයක් තිබිලා නෑ. එතකොට, අනාගතයේ වෙන්ට පුළුවන්ද?... එහෙනම්, අනාගතයේ වෙන්ටත් බෑ. මේ මොහොතෙත් ආත්මයක්, 'මම' කියලා, 'මගේ' දෙයක්, 'මගේ' කියලා අල්ල ගන්ට, ග්‍රහනය කරගන්ට නැත්නම්, ඊලග මොහො තෙත් නෑ. මේ මොහොතෙත් 'මම' නොවේනම්, 'මගේ' නොවේනම්, මැරෙණ මිනිහෙක් ඉන්ට පුළුවන්ද? දැන් ජීවත්වෙන මිනිහෙකුත් නෑනේ?...එහෙම බැලුවහම, 'මම' කියලා, 'මගේ' කියලා දෙයක් නැත්නම්, මැරෙන්ට ඕනේ 'මම' හෝ 'මගේ'දෙයක්නේ? මේ මොහොතෙත් නැත්නම්, මැරෙණ කෙනෙකුත් නෑ. මැරෙණ කෙනෙකුත් නැත්නම්, ඉපදෙන කෙනෙක් ඉන්ට පුළුවන්ද?.. ඉපදෙන කෙනෙක් ඉන්ටත් බෑ.

එහෙමනම්, මේ වෙන්නෙ මොකද්ද?...මෙන්න මේ 'දේ නොදන්නා කම'! ඒකයි බුදුහාමුදුරුවෝ ඒක හැඳිනුවේ 'අවිජ්ජාව' කියලා. මේ පරම සත්‍යය, මේ ආයතන ස්පර්ශ වීම නිසා, ආධ්‍යාත්මික ආයතන බාහිර ආයතන හා ස්පර්ශ වීම නිසා විඤ්ඤාණය හටගන්නවා, ඒත් සමග හටගන්නා පස්ස, වේදනා, සංඥා...ඒ ක්‍රියාවලිය හඳුන්වනවා පඤ්ච උපාදානස්කන්ධය කියලා. මේ පඤ්ච උපාදානස්ක න්ධයේ ඇතිවීම, නැතිවීමක් මිස, සදාකාලික කිසිවක් නෑ, කියන එක තමයි මේ බුදුහාමුදුරුවන්ගේ දහමේ කියන්නේ. එසේ, ඒ බව නොදන්නා කමට තමයි බුදුන්වහන්සේ කිව්වේ 'අවිජ්ජාව'කියලා.

දැන්, චතුරාර්‍ය සත්‍යයේ දුක්ඛ ආර්‍ය සත්‍යය කියනකොට, ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා....කියලා, අපි දන්නා දුක කියාගෙන ගිහිල්ලා, අන්තිමට කියනවා, සංකිත්තේන පඤ්චුපාදා නක්ඛන්ධා දුක්ඛා කියලා. එතකොට, බුදුහාමුදුරුවෝ කියනවා, මේ දුක කියන්නේ ඇත්තටම ගත්තොත්,

කෙටියෙන් ගත්තොත්, සංක්ශිප්තව ගත්තොත්, මොකක්ද?... මේ පඤ්ච උපාදානස්කන්ධයමයි දුක. එතකොට, මේ පඤ්ච උපාදානස්කන්ධයේ දුක මිස වෙනත් දුකක් නෑ අපිට. එතකොට, මේක ඇයි දුක වෙන්නේ?.. මේක හේතු නිසා හටගන්නවා. හේතු නැතිවෙනකොට නිරුද්ධ වෙනවා. එතකොට, ඇතිවෙන නැතිවෙන දෙයක් සැපයිද?.. දුකයිද?, සැපයි කියලා ගන්ට බෑ තර්කානුකූලව. මොකද? එහෙමනම්, සදාකාලිකව තියෙන්ට ඕනෙනේ?…ඒ හින්දා තර්කයක් වශයෙන් ගත්තොත්, ඇතිවෙන, නැතිවෙන දෙයක් දුකයි. යමක් ඇතිවෙන, නැතිවෙන හින්දා අනිච්චයි කිව්වා. යමක් අනිච්චනම්, එය සැපයි නෙවෙයි, එය දුකයි කියලා බුදුන් වහන්සේ දේශනා කරා. එතකොට, යමක් අනිච්චනම්, දුකනම් 'මම' යැයි 'මගේ' යැයි ගත හැකිද අල්ලගන්ට?, උපාදාන කරගන්ට වටිනවද? කියලා ඇහුවා භික්ශූන්ගෙන්. එහෙනම් නෑ. ඒ නිසා තමයි බුදුන්වහන්සේ කිව්වේ, මේ පඤ්ච උපාදානස්කන්ධය අනිච්චයි, දුක්ඛයි, අනාත්මයි කියලා. එතකොට, දැන් මේක තමයි අපිට දකින්ට කිව්වේ. මෙය නොදන්නාකම, මේ පඤ්ච උපාදානස්කන්ධය තමයි අපි අල්ලගෙන ඉන්නේ. ඒක අනිච්චයි දුක්ඛයි අනාත්මයි කියලා නොදන්නාකමම තමයි අවිජ්ජාව, එය එසේයැයි දැනගැනීම තමයි විජ්ජාව.

දැන් 'විජ්ජාව' පහළ කරගන්නනම්, මේ සියල්ල අනිච්චයි, දුක්ඛයි, අනාත්මයි කියලා දැක්කනම්?.. අවිජ්ජා පච්චයා සංඛාරා. මොකද්ද වෙන්නේ? 'අවිජ්ජාව' නිරුද්ධ වෙනවා. එතකොට, 'විජ්ජාව' පහළ වෙනවා. අවිජ්ජාව නිසා තමයි සංඛාර හටගන්නේ. දැන් විජ්ජාව පහළ උනානම්, මොකද වෙන්නේ?… අවිජ්ජාව නිරුද්ධයි. අවිජ්ජාව නිරුද්ධ උනහම මොකද වෙන්නේ?.. සංඛාර නිරුද්ධයි . සංඛාර නිරුද්ධනම් මොකද වෙන්නේ? විඤ්ඤාණය නිරුද්ධයි. විඤ්ඤාණය නිරුද්ධ නිසා නාම-රූප නිරුද්ධයි. නාම-රූප නිරුද්ධනම් සළායතන නිරුද්ධයි. සළායතන නිරුද්ධනම් ස්පර්ශය, පස්ස නිරුද්ධයි. ස්පර්ශය නිරුද්ධනම් වේදනාව නිරුද්ධයි. වේදනාව නිරුද්ධනම් තණ්හාව නිරුද්ධයි. තණ්හාව නිරුද්ධ නිසා උපාදානය නිරුද්ධයි. උපාදානය නිරුද්ධ නිසා භවය නිරුද්ධ වෙනවා. භවය නිරුද්ධනම් ජාතිය නිරුද්ධ වෙනවා, ජාතිය නිරුද්ධනම් ජරා, මරණ, ශෝඛ, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස කියන මේ සියල්ල නැතිව යනවා. දැන්, මිනිස්සුන්ට තියෙන ප්‍රශ්නේ මේ ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්සනේ. දැන්, මේ ටික නැත්නම් මේක හරිම හොඳයිනේ?.., නමුත් බුදුහාමුදුරුවෝ කිව්වා, නෑ! ඒක වෙන්නේ නෑ. මෙන්න මේක තමයි ක්‍රියාවලිය.

අපි දැන් හොයන්නේ, මේ ජරා, මරණ නැති තැනක්. ඉතින් ජරා, මරණ නැති තැනක් වෙන්ටනම්, අපි ඒ විද්‍යාව පහළ කරගෙන, එතන ඉඳලා අවිජ්ජාව දුරු කරලා, අවිජ්ජාව නිරුද්ධ කරලා, මේ ටික නිරුද්ධ කරගෙන යන්ට ඕනේ. මේක තමයි බුද්ධදේශනාව. එතකොට, දැන් මේක තමයි බුදුහාමුදුරුවෝ  අවුරුදු 45 ක් පුරා අපිට කිව්වේ. එතකොට, දැන් ආත්මයක් ඇත කියන එක, එක සංකල්පයක්. ආත්මයක් නැත කියන එක, තවත් සංකල්පයක්. මේ සංකල්ප දෙකම නෙවෙයි බුදුහාමුදුරුවෝ  කිව්වේ. මේ දෙකම බුදුහාමුදුරුවෝ ප්‍රතික්ෂේප කරනවා. මෙය ඇතිකල, මෙය වේ. මෙය නැතිකල, මෙය නොවේ . මෙය ඇතිවීමෙන්, මෙය සිදුවේ. මෙය නැතිවීමෙන්, මෙය නැතිවේ. එතකොට, ‘මෙය’ කිව්වේ අවිජ්ජාව. අවිජ්ජාව තියෙනකම් සංඛාර සහ ඒ ක්‍රියාවලිය සිද්ධ වෙනවා. අවිජ්ජාව දුරු උනාට පස්සේ මේක නිරුද්ධ වෙනවා. මේක තමයි බුදුන් වහන්සේගේ, විද්‍යාව. බුදුන් වහන්සේගේ “Science” එක මේක තමයි. දැන්, මේකට Technically Sound වෙන්ට ඕනේ නෑ. ලොකු උපාධි ඕනේ නෑ. P.H.D ඕනේ නෑ. වෛද්‍යවරයෙක් වෙන්ට ඕනෙත් නෑ. ඉංජිනේරුවෙක් වෙන්ට ඕනෙත් නෑ. තර්ක කරලා මේක ගන්ට බෑ. ලොජික් (Logic) වලින් බෑ මේක. මේක දකින්ට ඕනේ!…

බුදුහාමුදුරුවෝ කියනවා, මහණෙනි, ඇස අනිච්චයි , රූපය අනිච්චයි, ඇසයි රූපයි නිසා හටගන්නා ස්පර්ශය අනිච්චයි. ස්පර්ශය අනිච්ච නිසා විඤ්ඤාණය  අනිච්චයි, විඤ්ඤාණය  අනිච්චය නිසා… කිය කිය, දිගට කියාගෙ න, කියාගෙන යනවා. එතකොට, බුදුහාමුදුරුවෝ  කිව්වේ මොකද්ද?… මේ සියල්ල, මේ ටික, අනිච්ච බව දැකගන්නවා, දැනගන්නවා, දැනගෙන කළකිරෙනවා, කළකිරීම නිසා නොඇලෙනවා, නොඇලීම නිසා මිදෙනවා, මිදුනට පසුව මිදුනු බව දන්නවා. මේක, සූත්‍ර ගනනාවක තියෙනවා. මේක තමයි බුදු දහමේ, අපිට ඔය සූත්‍ර පිටකය ඔක්කෝම ගවේශනයකරහම අවසානෙට ගන්ට තියෙන්නේ. හැබැයි මේ ටික කල්පනා කරලා ගන්ට බෑ. බණ අහලා  ගන්ටත් බෑ. Technically Sound වෙන්ට ඕනේ නෑ. මොකද?… හේතුව, සෝථාපත්ත උනා සෝපාක අවුරුදු හතේදි!…මොනම අධ්‍යාපනයක්වත් තිබුනා කියලා අපිට විශ්වාස කරන්ට බෑ. සංකිච්ච, මහා පණ්ඩිත රහතන් වහන්සේ කෙනෙක්. අවුරුදු හතේදි රහත් වෙන්නේ. එතකොට, මේ ටික ඔක්කොම ඉගෙනගෙ න නෙවෙයි කොණ්ඩඤ්ඤ තවුසා පළවෙනි දවසේ සෝථාපත්ත වෙන්නේ. සියළුදෙනාම රහත් ඵලයට පත්වෙන්නේ දවස් හත, සතිය ඉවර වෙනකොට. දැන්, මේක තමයි ඇත්ත කතන්දරේ.

මේක නොදන්නා අය නොයෙකුත් කතන්දර හදාගෙන බණ කියනවා. අපිට ඕනේ, ඕනේ ජාති කියන්ට බෑ. අපේ සංකල්ප හරියන්නේ නෑ. බුදුන් වහන්සේගේ මුළු දේශනාවම අරගෙන අපි මේවා විග්‍රහ කරන්ට ඕනේ. මම ගිය සැරේ දේශනාවෙදී කිව්වා, බුදුන් වහන්සේ වදාළේ මොකද්ද කියලා දම්සක් සූත්‍රය ඇසුරින්, පස්වග තවුසන්ට දේශනා කරපු. මිනිස්සු ගොඩක් ඒකෙන් අවදි උනා.

**(මෙහිදී මහ තෙරුණුවන් විසින් සඳහන් කළ එම දේශනාවේ මාතෘකාව වන්නේ "නිවන් දකින්නේ මෙහෙමයි."- මෙම දේශනාව 2018 වසරේ නොවැම්බර් මස 10 වන දින මහ තෙරුණුවන්ගේ අවසරය මත විඩියෝපටයක් ලෙස පටිගත කරන ලදී.)**

දැන්, ඊලගට මේ ගැටළුව තියෙනවා. දැන්, යළි උපදිනවද?.. නැත්ද?.. දැන් ‘මම’ කියලා කෙනෙක් නැත්ද?, ඉන්නවද?, මුකුත් නැත්ද?, ශුන්‍යතාවයක්ද තියෙන්නේ? එතකොට, මේ වගේ ගැටළු ගොඩකට මැදි වෙනවා ඉතින්! මේක තමයි ඉතින් පෘතක්ජනභාවය. මේක තියෙනකම්, මේ අවිජ්ජාව තියෙනකම්, මේ ගැටළුව තියෙනවා. හැබැයි මේක දුරු කරගන්ට, මේ පරම සත්‍ය දැකලා මේ දුකෙන් ගැලවෙන හැටි තමයි බුදුන්වහන්සේ අපිට දේශනා කරේ, ආර්‍ය අෂ්ටාංගික මාර්ගය හරහා. එතකොට, අපිට ඕන කරන්නේ විජ්ජාව පහළ කරගන්ටනේ, අවිජ්ජාව දුරු කරලා. දැන්, අවිජ්ජාව නිසානේ මේ දුක, මේ ක්‍රියාවලියට හේතුව. එහෙමනම්, අපි මෙකෙන් ගැලවෙන්ටනම් විජ්ජාව පහළ කරගන්ට ඕනේ. විජ්ජාව පහළ උනොත් විතරයි අවිජ්ජාව දුරු වෙන්නේ. අර අඳුර දුරු කරගන්ට ආලෝකය ඕනනේ. එතකොට, විජ්ජාව පහළ කරගන්ටනම් අපි කරන්ට ඕනේ මොකද්ද?... ආර්‍ය අෂ්ටාංගික මාර්ගය වඩන්ට ඕනේ. සම්මාදිට්ඨි , සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි, ඒ ටික වඩාගෙන යනකොට සම්මා ඥාන, සම්මා විමුක්ති කියලා ඉතුරු ටිකත්, ඉතුරු අංග දෙකත් වැඩිලා, දස අංගයෙන් සමන්නාගත මහා රහතන්වහන්සේ නමක් බවට ඔහුට පත්වෙන්ට පුළුවන්. මේක තමයි බුද්ධ දේශනාව.

ඉතින්, මම මේ උත්සාහයක් දැරුවේ මේ, මොකද්ද මේ , මිනිස්සු දැන් හරියට අහනවා, අපි යළි ඉපදෙනවද?, නැත්ද?, මොකද්ද මේ බුදුහාමුදුරුවෝ කිව්වේ?. පුනර්භවයක් ගැන කිව්වද?, අන්තරාභවයක්ගැන කිව්වද?, ‘මම’ ඉන්නවද?, නැත්ද?. දැන් පැහැදිළීනේ ?...දැන් මේ, ආත්ම සංකල්පයක් නෑ.

ඒක අන්ත දෙකක්. ආත්මයක් ‘ඇත’ යන්න එකක්, ‘නැත’ යන්න තව එකක්. මේ කියන අන්ත දෙක ‘උච්චේද වාදය’ සහ ‘සාස්වත වාදය’ කියලා හැඳින්වුවා. ආත්මයක් තියෙනවා කියන එක ‘සාස්වත වාදය’ හැටියටත්, ආත්මයක් නැත කියන එක ‘උච්චේච වාදය’ ලෙසත්. මේ දේකම නෙවේ බුදුහාමුදුරුවෝ කිව්වේ. මේ දෙකම ප්‍රතික්ෂේප කරනවා. අවිජ්ජාව නිසා සංඛාර හටගන්නවා කියලා ඒ ක්‍රියාවලිය කිව්වා. මැදින් දහම් දෙසනවා කියලා. එතකොට, ද්විත්ව කතන්දර නෑ. මේක ඉගෙන ගන්ට මහා ලොකු උපාධි, අධ්‍යාපන අවශ්‍ය නෑ. මේ, බුදුහාමු දුරුවෝ කියපු විදිහට ආරණ්‍යගතෝවා,රුක්ඛමූලගතෝවා, ශූන්‍යාගාරගතෝවා, කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙ න් වෙන්ව, ප්‍රථමධ්‍යානයට සමවදින්ට පුළුවන්, දුතියාධ්‍යානයට, ඒ ආදී වශයෙන් ගිහිල්ලා පංචනීවරණ දුරු කරලා, සතර සතිපට්ඨානය වඩලා, රාග, ද්වේශ, මෝහ කියන අකුසල් මූලයන්, මුලින්ම ගලවලා දාලා, සක්කායදිට්ඨි, විචිකිච්චා, සීලබ්බත පරාමාස, කාම- රාග, පටිඝ, රූප රාග, අරූප රාග , මාන, උද්දච්ච , අවිජ්ජා කියන සංයෝජන දහය දුරු කරලා, සසරෙන් ගැලවෙන්ට, රහත් ඵලයට පත්වෙන්ට ඕනේ. මේක තමයි බුද්ධ වචනය. මේක තමයි බුදුහාමුදුරුවෝ කිව්වේ . ඉතින්, ඒක නිසා මම මේ උත්සාහයක් දැරුවා. ආත්ම, අනාත්ම සහ ඉන්නවද?, නැද්ද? මේ ගැන බුදුහාමුදුරුවෝ මොනවද කිව්වේ කියලා කියන්ට යම්කිසි උත්සාහයක් දැරුවා. මම දන්නේ නෑ ඒක කොච්චර සාර්ථකද කියලා. ඔගොල්ලොන්ට තේරුණාද?, නැත්ද?, කියන එක ඔගොල්ලෝ තීරණය කරන්ට.”

**නිමි.**

**2018 නොවැම්බර 17**

# ගවේශනය කිරිමට

*** අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේගේ සියළුම පටිගත කරන ලද දේශනා ශ්‍රවනය කිරීමට පහත YOUTUBE සහ FACEBOOK links වලට පිවිසෙන්න.**

**CHANNEL LINK:**




https://www.youtube.com/channel/UCwTkvCz1d-3F1bXbqzfedVQ

**LINKS:**

**“THE PATH TO NIBBANA”**

https://www.facebook.com/ThePathToNibbana/

**“සම්මා දිට්ඨි - SAMMĀ DITTHI”**
**ප්‍රබුද්ධ ජන සමාජයක් උදෙසා, බෞද්ධ දර්ශනය.**

https://www.facebook.com/WajirabuddhiTheroSammaDitthi/

*** අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේගේ පටිගත කරන ලද දේශනා සහ දේශිත සද්ධර්ම ලිපි ඇතුළත් එම වෙබ් අඩවිය(WEBSITE).**

**LINK:**

**“නිවන් මග - අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේගේ දේශනා ආශ්‍රිතව සැකසුනු වෙබ් අඩවියකි”**

https://www.mahanuwara-wajirabuddhi-thero.org/si

“The Path to Nibbāna” සහ "සම්මා දිට්ඨි - Sammā Ditthi" යන නමින් ඇති එම Facebook පිටුද, YouTube හි "අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේ” යන නමින් ඇති එම චැනලයද එමෙන්ම, 'නිවන් මග’ (https://www.mahanuwara-wajirabuddhi-thero.org/si) නමින් ඇති අතිපූජනීය මහනුවර වජිරබුද්ධි මහ රහතන්වහන්සේගේ දේශනා ආශ්‍රිතව සැකසුනු එම වෙබ් අඩවිය ඇතුළු ඒ සියල්ල පවත්වාගෙන යනු ලබන්නේ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම සොයන ගිහි පිරිසක් විසිනි. අපගේ අරමුණ සංස්කෘතික හා සාම්ප්‍රදායික හේතූන් මත වැලලී ගිය නිර්මල බුදු දහම ඉස්මතු කර එය ධම්ම දානය ලෙස ලෝකයාහට බෙදාහැරීමේ උත්සාහයක් බව කරුණාවෙන් සලකන්න.